# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


**2025.01.10** **මාධ්‍ය නිවේදන අංක - 2025/002(සංශෝධිත)**

**ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ**

**සියළු මාධ්‍ය ආයතන**

<u>**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට නව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කෙරේ.**</u>

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 17 (1) වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව ගරු ජනාධිපතිතුමාගේ 2025.01.08 දිනැති පත්කිරීම අනුව මහාධිකරණ විනිසුරු රංග ශ්‍රීනාත් අබේවික්‍රම දිසානායක මහතා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නව අධ්‍යක්ෂ ජනරාල් ලෙස 2025 ජනවාරි මස 10 වන දින රාජකාරි ආරම්භ කරන ලදි.

මීට පෙර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරන ලද මහාධිකරණ විනිසුරු ඩබ්.කේ.ඩී.විජේරත්න මහතා 2024.10.07 වන දින අධ්‍යක්ෂ ජනරාල් ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පසු පනතේ 25 (2) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ බලතල, කර්තව්‍යය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම්.ආර්.වයි.කේ.උඩවෙල මහත්මිය (නව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කරන තෙක්) 2024.10.10 දින සිට පත් කරන ලදි. එදින සිට මේ දක්වා කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ උපදෙස් පරිදි එතුමිය විසින් නඩු ගොනු 62 කට අදාළ අධි චෝදනා පත්‍ර සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු සිදු කර ඇත.

මෙය කෙටි කාලයක් තුළ කොමිෂන් සභාව විසින් අත්කරගත් සුවිශේෂී කාර්යසාධනයක් ලෙස දැක්විය හැකිය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
011 250 2672